**හාලිඇල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාව 2013 ජුලි 19 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇත හාලිඇල ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.8,255,542 ක් වූ උසාවි දඩ ආදායම ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු.4,471,416 ක් වූ උසාවි දඩ ආදායම ආදායම් හා වියදම් ගිණුමේ රු.19,541 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම රු.4,451,875 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.1,023,044 ක් රු.925,462 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.97,582 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ඉටු නොකළ කර්මාන්ත 05 ක වටිනාකම වූ රු.3,500,000 ක් ණයගැතියන් හා ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා ණයගැති හා ණයහිමි ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත සඳහා වූ සියයට 10 ක අත රැඳවුම් මුදල් රු.2,015,925 ක් ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුම වෙනුවට ණයහිමි ගිණුමට සටහන් කිරීම නිසා

ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද ආපසු ගෙවිය යුතු තැන්පතු එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

2013 මැයි 23 දින වන විට විගණන විමසුම් 10 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.339,054 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,384,352 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 7,605 | 1,753 | 4,737 |
| (ii) | බදු කුලී | 1,265 | 1,280 | 422 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,869 | 1,604 | 4 |
| (iv) | වෙනත් ආදායම් | 33,482 | 69,588 | 29,637 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,803,666 |
| (ii) | මුද්දර ගාස්තු | 2,926,720 |

## 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (i) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන රු.10,000 ක මාසික දීමනාවක් ගෙවීමේ පදනම මත අනියම් සේවකයන් 17 දෙනෙකු සභාපතිවරයා විසින් සේවයට බඳවාගෙන තිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 වෙ ix දරන ලිපිය අනුව කාර්යාල වේලාවෙන් බැහැරව පැය දෙකකට නොවැඩි කාලයක් පැවැත්විය යුතු සැලසුම් කමිටුවේ සාමාජිකයින්ගේ පැමිණීම හා පිටවීම ඇතුලත් අත්සන් ලේඛණයක් මගින් කමිටුව පැවැත්වූ කාලය තහවුරු කර නොගෙන 2012 වර්ෂයේ පැවති සැලසුම් කමිටු 11 ක් වෙනුවෙන් සැලසුම් කමිටු සාමාජකයින්ට රු.22,800 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) සභාවේ නව බහුකාර්ය ගොඩනැගිල්ලේ තිර රෙදි යෙදීම වෙනුවෙන් ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර රු.375,942 ක් වැයකර තිබුණි. මිළ කැඳවීමේ දී පිරිවිතර සඳහන් කර නොතිබුණ අතර ඉදිරිපත් කර තිබූ මිල ගණන් 03 ක සාම්පල් පරීක්ෂා කිරීමක් හෝ මිල ගණන් සැසඳීමක් ද කර නොතිබුණි.

(ඇ) ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2009 නොවැම්බර් 11 දිනැති අංක 12/ආ/15/1 දරන ලිපිය ප්‍රකාරව සභාපතිවරයා සඳහා අනුමත මාසික ඉන්ධන ප්‍රමාණය ඩීසල් ලීටර් 252 ක් ඉක්මවා 2012 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල අනුමැතියක් ලබා නොගෙන ඩීසල් ලීටර් 2,308 ක් සඳහා සභා අරමුදලින් රු. 266,112 ක් ගෙවා තිබුණි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

කැටවල ප්‍රාදේශීය සභා උප කාර්යාලය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය සඳහා කැටවල සමෘද්ධි බලකාය වෙත අවස්ථා 02 කදී රු.744,279 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2013 ජනවාරි 16 දින සිදුකල පරීක්ෂාවේ දී වැඩ විෂය අංක 2 යටතේ වහලය ලෙවල් කිරීමේ බිත්ති එසවීමට දිය සෙවෙල සහිත පැරණි පිලිස්සූ ගඩොල් භාවිතා කර තිබූ අතර, ඒවා කලු පැහැයෙන් යුතුව අවපැහැ ගැන්වී තිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත හා වෘත්තීන් සම්බන්ධයෙන් බදු අයකළ යුතු ව්‍යාපාර සමීක්ෂණයක් මගින් හඳුනාගෙන නොතිබිණි.

(ආ) සභාවට අයත් නිලධාරි නිල නිවාසවල පදිංචිකරුවන්ගෙන් ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 ඡේදය ප්‍රකාරව කුලී අයකර ගැනීමට කටයුතු නොකර සභා තීරණයන් මත නිවාස කුලී අයකරමින් තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මූල්‍ය බලතල පවරා නොතිබුණ අතර, නිලධාරීන්ගේ විෂයයන් වෙත රාජකාරි පවරා රාජකාරි ලැයිස්තුද පිළියෙල කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ නොවැම්බර් මාසය වෙනුවෙන් පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව නිකුත් කර මාස 06 ක් ඉක්මවූ ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු.108,851 ක් වටිනා චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ගෝඝාතකාගාරය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන ජාතික පාරිසරික පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට අනුව පාරිසරික අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කළ අංක 1159/22 සහ 2000 නොවැම්බර් 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ " අ " උපලේඛණය ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

(ඊ) 2011 හා 2012 වර්ෂවල අවස්ථා 04 කදී ලබාදුන් රු.48,297 ක් වූ අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව පියවා නොතිබුණි.

(උ) ස්ථාන මාරුවී ගිය, සේවය අත්හිටවූ හා මියගිය සේවකයින් 14 දෙනෙකුගෙන් වසර 03 කට අධික කාලයක සිට අයවිය යුතුව පවතින රු. 166,323 ක් වූ ණය අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා 2005 මාර්තු 24 දිනැති ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අංක 2/මු/1 දරන ලිපිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 ප්‍රකාරව රජයේ මුදල්, වත්කම් භාරව කටයුතු කරන, වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන සභාවේ සේවයේ නියුතු නිලධාරීන් ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව සභාව සතු වාහන 05 ක් වෙනුවෙන් ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණ අතර, මුදල් රෙගුලාසි 1646 ප්‍රකාර එම වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ද පිළියෙල කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය